කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර zonal Education Office – Kalutara வலயக்கல்விக் காரியாலயம் களுத்துறை කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

# කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

## මධ්‍ය වාර පරීක්ෂණය - 2018

10 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව | කාලය පැය 03 යි

නම:- ............................................... විභාග අංකය:- ............................

**සියළුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.**

- පහත සඳහන් පද්‍ය සහ කවි ආශ්‍රයෙන් ප්‍රශ්න අංක 01 සිට 04 දක්වා පිලිතුරු සපයන්න.

(a). තෝව දෙන්නෙත් නරියට යි  
තෝව ගන්නෙත් නරියෙකු යි  
තෝව දෙන්නෙත් තෝව ගන්නෙත්  
කැලේ ඉන්නා නරියෙකු යි

(b). ඉර දෙවියන්ගේ ඉරගල ගාවා  
සඳ දෙවියන්ගේ සඳ ගල ගාවා  
ගණ දෙවිඳුගේ කෝවිල ගාවා  
අපිත් කෙලිමු ලී සබමැද බෝවා

(c). ඇහළ මලින් ගස් පිරිලා  
බලන්න හරි ලස්සනයි  
අඹ රඹුටන් ජම්බු ඉදිලා  
අද හැම තැන හරි හැඩයි.

(d) සොකරී එන්නී සබයෙන් අවසර ගන්නී  
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී  
පද අල්ලන්නී පියයුරු ලැම සොලවන්නි  
කැඩපත ගන්නී සුරතින් මුණ බලන්නී

01). ඉහත (a) වැනි පද්‍යය පහත කවර කවියක ආභාෂය පෙන්නුම් කරයිද?

(i) ඉර පායන කල මොනරිඳු දෙන්නෙක් (ii) තෙලින් බැද්දත් කොබෙයියා

(iii) බොලං පොඩි නංගි ටිකක් හිටපං (iv) අඹ අඹුටන් ගස් දෙක යට

02).ඉහත (c) පද්‍යය පහත දැක්වෙන කවර කවියක ආභාෂය පෙන්නුම් කරයිද?

(i) හං රොඩු හං රොඩු හං රොඩු ගොල්ලෝ.

(ii)රුද රුද රුකුඳත් රුකුඳ ගතෙයි.

(iii)අඹ රඹුටන් ගස් දෙක යට.

(iv)බොලං පොඩි නංගි ටිකක් හිටපං.

03).උඩරට ගැමි නාටකයක් නියෝජනය කරන කවිය වනුයේ,

(i).a (ii). b (iii). c (iv). d

04). 'නෘත්ත' ගණයට අයත් කවියක් අඩංගු වරණය වන්නේ,

(i).a (ii). b (iii). c (iv). d

05).නාට්‍ය කලාවේ මූලික අරමුණ දැක්වෙන වරණය කුමක්ද?

(i). පණිවිඩයක් දීමයි. (ii). සෞන්දර්යාත්මක වින්දනයක් ලබා දීම.

(iii). මුල මැද අග ගැලපීම. (iv). හාස්‍ය රසය මතු කිරීමයි.

06). 'අනුෂංගික' කලා ශිල්ප ඇතුළත් වරණය වනුයේ කුමක්ද?

(i). රංග වස්ත්‍ර, රංග භාණ්ඩ, පසුතල, රංගාලෝකය.

(ii). රංග වස්ත්‍ර, රංග භාණ්ඩ, පිටපත, රංගාලෝකය.

(iii). රංග වස්ත්‍ර, පසුතල, අභිනය, රංග භාණ්ඩ.

(iv). වේදිකාව, නාට්‍ය පිටපත, රංගාලෝකය, පසුතල.

07).'තරුණ රංගන ශිල්පියෙකු මහල්ලෙකුගේ චරිතයක් සඳහා අංග රචනා කරනු ලබයි. ' මේ සඳහා යොදා ගනු ලබන්නේ මින් කුමන අංග රචනා ක්‍රමය ද?

(i). විකාර රූපී අංග රචනයකි. (ii).සරල අංග රචනය යි.

(iii).චරිතාංග අංග රචනයයි. (iv).නාට්‍ය ධර්මී අංග රචනයයි.

08).වේදිකා නාට්‍යයක රඟා පැවැත්ම වඩාත් තීරණය වන සාධකය කුමක්ද?

(i). නාට්‍යය සංගීතයයි.

(ii). ප්‍රේක්ෂක ප්‍රතිචාරයයි.

(iii). නළු නිළියන්ය.

(iv). අධ්‍යක්ෂකවරයාය.

09).ප්‍රාසාංගික කලා පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(i). නර්තනය, මුද්‍රා නාට්‍ය, සංගීතය, ඔපෙරා, නාට්‍යය.

(ii).නර්තනය, චිත්‍ර කලාව, සාහිත්‍යය, මූර්ති ශිල්පය, ඔපෙරා.

(iii).සංගීතය, මූර්ති ශිල්පය, නාට්‍යය, මුද්‍රා නාට්‍යය, ගීත නාටකය.

(iv).ගීත සාහිත්‍ය, චිත්‍ර කලාව, මුද්‍රා නාට්‍ය, සංගීතය, නර්තනය.

10).රංග භූමිය ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් ගණන,

(i). 6 කි. (ii). 9 කි. (iii). 5 කි. (iv). 7 කි.

11).ක්ෂණික නිරූපනයක් ඉදිරිපත් කිරීමට යාමේදී,

(i). වාචික අභිනය භාවිතා නොකරයි.

(ii). පිටපතක් අවශ්‍ය වේ.

(iii). තමාගේ නිර්මාණාත්මක බව ප්‍රදර්ශණය කරයි.

(iv). දිගු කාලීන පුහුණුවක් අවශ්‍ය වේ.

12).අංග රචනයේදී 'රිමූවින් ක්‍රීම්' (Removing Cream) භාවිතා කරන්නේ කුමක් සඳහා ද?

(i). හැඩතල මතු කිරීමට ය.

(ii).මුහුණේ මේක් අප් (Make Up) ඉවත් කිරීමට ය

(iii).රැවුල් ඇලවීමට ය.

(iv).දත් වර්ණ ගැන්වීමට ය.

13).'රංග විධාන' අවශ්‍ය වන්නේ කවුරුන් සඳහා ද?

(i). ප්‍රේක්ෂකයන්ට ය. (ii). නළුවන්ට ය.

(iii). අනුෂාංගික ශිල්පින්ට ය. (iv). නාට්‍ය විචාරකයින්ට ය.

14).නාට්‍යයේ සාහිත්‍යමය කොටස ලෙස සලකන්නේ කුමක්ද?

(i). ඇඳුම් පැලඳුම් ය. (ii). අංග රචනය ය.

(iii). අනුෂාංගික ශිල්පින්ට ය. (iv). නාට්‍ය පිටපත ය.

15).වර්තමානයේ බහුලවම දක්නට ලැබෙන නාට්‍ය රඟ දක්වන වේදිකාව වනුයේ.

(i). ප්‍රොසීනියම් වේදිකාව. (ii). කැරකෙන වේදිකාව.

(iii). රවුම් වේදිකාව. (iv). ත්‍රිකෝණාකාර වේදිකාව.

16).'වේදිකා නාට්‍යක්'යනු කුමක්ද?

(i). ඒකල ප්‍රයත්නයක යහපත් ප්‍රතිඵලයකි.
(ii). සජීවී කලාවකි.
(iii). පිටපත රචකයාගේ කලාවකි.
(iv). ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ගොඩ නැගෙන්නකි.

- **පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් 17 සිට 20 තෙක් ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.**

| ක | ග | ජ | ට |
|---|---|---|---|
| කුවේණි | බෝඩිංකාරයෝ | දිත්තල කාලගෝල | ජන කරලිය |
| රතු හැට්ටකාරී | විජය නන්දසිරි | ජනේලය | විකෘති |
| ගාමිණී සමරකෝන් | බෙර හඬ | මානෙල් ජයසේන | සුභ සහ යස |
| ශ්‍රියන්ත මෙන්ඩිස් | ජැක්සන් ඇන්තනී | සිංහබාහු | හෙන්රි ජයසේන |

17).ලංකාවේ සම්මත වේදිකා කලාවේ වෙනසක් සිදු කරන ලද නාට්‍යකරුවා අයත් කාණ්ඩය

(i).ක ය. (ii). ග ය. (iii). ජ ය. (iv). ට ය.

18).ලෝක ධර්මී ශෛලියට අයත් නාට්‍ය කාණ්ඩය,

(i).ක ය. (ii). ග ය. (iii). ජ ය. (iv). ට ය.

19).ප්‍රකට නාට්‍යකරුවෙකු වූ හෙන්රි ජයසේනයන්ගේ බිරිඳ අයත් කාණ්ඩය

(i).ක ය. (ii). ග ය. (iii). ජ ය. (iv). ට ය.

20).හාස්‍ය රංගනය සඳහා ප්‍රකට රංගන ශිල්පියා සිටින කාණ්ඩය වනුයේ,

(i).ක ය. (ii). ග ය. (iii). ජ ය. (iv). ට ය.

21).වේදිකා නාට්‍යය අනෙකුත් කලාවන්ට වඩා සුවිශේෂී වන්නේ කුමක් නිසාද?

(i). නළුනිළියන් ඇති නිසා. (ii).වේදිකාවක් ඇති නිසා.

(iii).ගැටුම් අවස්ථා ඇති නිසා. (iv).සජීවී මාධ්‍යක් නිසා.

22).වර්ණ පිළිබඳ වඩාත් අවධානය යොමු කරන ශිල්පීන් වන්නේ,

(i). රංගාලෝක, පසුතල, රංග වස්ත්‍ර, අංගරචන.

(ii). රංගභාණ්ඩ, පිටපත් රචක, රංග වස්ත්‍ර, අධ්‍යක්ෂ.

(iii). සංගීතය, පසුතල, අංග රචනය, පිටපත් රචක.

(iv).රංගාලෝක, අංග රචන, පසුතල, නර්තනය.

23).ස්වාභාවික චලන යනු,

(i). පරිකල්පනය භාවිතා කොට ඉදිරිපත් කරනු ලබන චලන වේ.

(ii). එදිනෙදා ජීවිතයේදී ආයාසයකින් තොරව කරනු ලබන චලන වේ.

(iii).අනුකරණාත්මක චලන වේ.

(iv).නිර්මාණාත්මකව ඉදිරිපත් කරන චලන වේ.

24).රංග ක්‍රීඩාවක් වන්නේ,

(i). අකුරු ක්‍රීඩාව. (ii). අංක ක්‍රීඩාව.

(iii). තෝරා සහ මෝරා ක්‍රීඩාව. (iv). ගස්මාරු ක්‍රීඩාව.

25).නාට්‍ය ධර්මී නාට්‍යක් සහ ලෝක ධර්මී නාට්‍යක් වන්නේ,

(i). මනමේ, සිංහබාහු.

(ii). දිත්තල කාලගෝල, කැළණි පාලම.

(iii). අහසින් වැටුණු මිනිස්සු, කැළණි පාලම.

(iv). නරි බෑනා, දිත්තල කාලගෝල.

- **පහත දැක්වෙන ඡායාරූප දෙක ආශ්‍රයෙන් 26 – 29 තෙක් ප්‍රශ්ණ වලට පිලිතුරු සපයන්න.**



A



B

26).මෙහි ‘A’ ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුවා වන්නේ,

(i). බන්දුල ජයවර්ධන මහතා. (ii).සයිමන් නවගත්තේගම මහතා.

(iii).ජයලත් මනෝරත්න මහතා . (iv).සුගතපාලද සිල්වා මහතා.

27).‘A’ රූපයේ දැක්වෙන නාට්‍යකරුවාගේ නාට්‍ය නිර්මාණයකි.

(i). නරි බෑනා (ii). මනමේ (iii). සුභ සහ යස (iv). කැළණි පාලම

28). මෙහි ‘B’ ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරුවා කවුද?

(i). හෙන්රි ජයසේන මහතා. (ii). දයානන්ද ගුණවර්ධන මහතා.

(iii). ධර්මසිරි බණ්ඩාරනායක මහතා . (iv). පරාක්‍රම කිරිඇල්ල මහතා.

29).‘B’ රූපයෙන් දැක්වෙන නාට්‍යකරුවාගේ නාට්‍ය නිර්මාණයකි.

(i). සිංහබාහු (ii). කැළණි පාලම (iii). කුවේණි (iv). බෙර හඬ

- **30 සිට 35 තෙක් ප්‍රශ්ණවලට නොගැළපෙන පිලිතුරු සපයන්න**

30).සතර අභිනය යනු,

(i). වාචික, ආංගික, සාත්වික, හා ආහාර්ය යන නම් වලින් හැඳින්වේ.

(ii).විශේෂයෙන් නාට්‍යයේ දී යොදා ගැනේ.

(iii).යුරෝපයේ බිහි වී මෙරටට සංක්‍රමණය වු සංකල්පයකි.

(iv).මුල් වරට සාකච්ඡාවට භාජනය වන්නේ භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයෙනි.

31).නාට්‍යය යනු,

(i). ලොව ඉපැරණි කලාවන්ගෙන් එකකි.

(ii).ජීවිතයේ නියත අනුකරණයන් නොවේ.

(iii).ප්‍රේක්ෂක පිරිසකගෙන් තොරව ඉදිරිපත් නොකළ හැකි කලා මාධ්‍යකි .

(iv).තනි පුද්ගලයකුගේ නිර්මාණයකි.

32).සමාරෝපය යනු,

(i). රංගභූමි පාලන සතු කාර්යයකි.

(ii).නළුවකු තමාගේ පෞද්ගලිකත්වය අතහැර අනෙකෙකුගේ ස්වරූපයක් ගැනීමය.

(iii).බාහිර හා අභ්‍යන්තරික වශයෙන් ප්‍රභේද දෙකකින් යුක්තය .

(iv).සාර්ථක රංගනයන් සඳහා අත්‍යාවශ්‍යය සාධකයකි.

33).නාට්‍යය ඉදිරිපත් කරනු ලබන ශෛලිය හා අනුගත විය යුතු නොවන සාධකය කුමක්ද?

(i). සංවාද. (ii).රංගාලෝකය. (iii).සංගීතය. (iv).අංග රචනය.

34).වේදිකා නාට්‍යක් යන්නට නොගැලපෙන ප්‍රකාශය කුමක්ද?

(i). කිසියම් ආකාරයක ජීවිතය අනුකරණය කිරීමකි.

(ii).කලා ප්‍රභේද කිහිපයක් සංකලනයෙන් බිහි වූවකි.

(iii).සෑම විටම සිද්ධි කාලානුරූපීව ගොනුකොට ඉදිරිපත් කරන්නකි .

(iv).ඕනෑම වැඩිහිටි ප්‍රේක්ෂක පිරිසකට ගෝචර විය යුත්තකි.

35).'රංගභූමි අලංකරණය' යන්නට නොගැලපෙන ප්‍රකාශය කුමක්ද?

(i). එහා මෙහා ගෙන යාමට සවි කිරීමට හා ගැලවීමට පහසු අයුරින් සකස් විය යුතුය.

(ii).'ප්‍රස්ත' යන නමින්ද හැදින්වේ.

(iii).සෑම නාට්‍යකටම අත්‍යාවශ්‍ය අංගයකි.

(iv).නාට්‍යක යොදනු ලබන සෑම රංගභූමි ආශ්‍රයෙන් ම නාට්‍ය ක්‍රියාවලිය හා සිද්ධ විය යුතුය.

- **පහත දැක්වෙන රංගන ශිල්පීන්ගේ ඡායාරූප** ආශ්‍රයෙන් **යෙන් 36 සිට 40 දක්වා ප්‍රශ්ණ වලට පිලිතුරු සපයන්න.**



A B C D E

36).C රූපයේ දැක්වෙන රංගන ශිල්පිනිය වන්නේ,

(i). චාන්දනි සෙනවිරත්න. (ii).අනුලා බුලත්සිංහල.

(iii).මානෙල් ජයසේන. (iv).මර්සි එදිරිසිංහ.

37).විකෘති නාට්‍යය සඳහා රංගන දායකත්වය ලබා දුන් රංගන ශිල්පිනිය වන්නේ,

(i). A ය. (ii).B ය. (iii).C ය. (iv).D ය.

38).B රූපයේ දැක්වෙන රංගන ශිල්පියා වන්නේ,

(i). හෙන්රි ජයසේන. (ii).ජැක්සන් ඇන්තනි.

(iii).ඩග්ලස් රණසිංහ. (iv).ශ්‍රියන්ත මෙන්ඩිස්

39).හාස්‍ය රංගනය සඳහා දායක වන රංගන ශිල්පියෙකි.

(i). A ය. (ii).B ය. (iii).C ය. (iv).D ය.

40). 'E' රූපයෙන් දැක්වෙන රංගන ශිල්පියා වන්නේ,

(i). විජේරත්න වරකාගොඩ

(ii).ඩග්ලස් රණසිංහ

(iii).ගාමිණී සමරකෝන්

(iv).විජය නන්දසිරි.

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්නය හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01).දිත්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරු කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1).මෙම නාට්‍යයේ රචකයා නම් කරන්න. (ලකුණු 02)

(2).මෙම නාට්‍යය අයත් ශෛලීය කුමක්ද? (ලකුණු 02)

(3).දිත්තල කාලගෝල නාට්‍යයට අයත් වූ ජාතක කථාව කුමක්ද? (ලකුණු 02)

(4).මෙම නාට්‍යයේ ප්‍රධාන චරිත 03 ක් නම් කරන්න. (ලකුණු 02)

(5).වඩාත් වැඩි කාලයක් දිත්තලාගේ චරිතය රඟපාන නිළිය නම් කරන්න. (ලකුණු 02)

(6).දිත්තල කාලගෝල නාට්‍යයේ ඇතුළත් ගීතයක මුල් කොටස ලියන්න. (ලකුණු 02)

(02)

(1).රූපණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

(2).රූපණ ශිල්පියෙකු සතු ගුණාංග 04 නම් කරන්න. (ලකුණු 04)

(3). රූපණය සාර්ථක කර ගැනීම උදෙසා සතර අභිනය ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03)

(1).අංග රචනය යනු කුමක්ද? (ලකුණු 02)

(2).අංග රචනය සඳහා යොදාගනු ලබන ද්‍රව්‍ය සහ උපකරණ වගුවක් ආශ්‍රයෙන් පෙන්වා

දෙන්න. (ලකුණු 04)

(3).අංග රචනය කිරීමේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04)

(1).ශ්‍රී ලාංකේය රංගන ශිල්පීන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02)

(2).ඔවුන් විසින් රඟපාන ලද නාට්‍ය 2ක් වෙන වෙනම ලියන්න. (ලකුණු 04)

(3).ඉන් ඔබ කැමති රංගන ශිල්පියකු පිලිබඳ කෙටි විස්තර ලියන්න. (ලකුණු 06)

(05)

(1).ආනුෂංගික කලා ශිල්ප යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

(2).නාට්‍යකට යොදා ගන්නා ආනුෂංගික කලා ශිල්ප 4ක් නම් කරන්න. (ලකුණු 04)

(3).ඉන් අනුශාංගික කලා ශිල්ප දෙකක් නාට්‍යයේ සාර්ථකත්වයට වැදගත් වන්නේ කුමන ආකාරයකින්දැයි විස්තර කරන්න. (ලකුණු 06)

(06)පහත දැක්වෙන අවස්ථාව පදනම් කර ගනිමින් කෙටි නාට්‍යකට සුදුසු පෙළ රචනයක් කරන්න. මෙහිදි ඔබගේ අභිමතය පරිදි නාට්‍ය යේ අවසානය නිර්මාණය කල හැකිය.

අල්ලපු ගෙදර දසහැවිදිරි නීලා ගේ කෑගැසීම් හඬ ඇසී ජනේලය තුළින් පියවතී ඒ දෙස බැලුවාය. නීලාගේ මව වන කුසුමා තම දරුවා තුරුළු කරගෙන හිස පිරිමදිමින් පියවතීගේ නිවස දෙස බලා උස් හඬින් බනින්නට පටන් ගත්තාය. දාහතර හැවිරිදි පියවතීගේ එකම දරුවා වන සිරිමල් මීට මොහොතකට පෙර වැට මායිමේ අඹ ගසට ගලක් ගසනු පියවතී දුටුවද සිරිමල්ට ඒ සම්බන්ධ අවවාදයක් කිරීමට ඇයට අමතක විය.

(i). නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීම. (ලකණු 04)

(ii)සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීම. (ලකුණු 08)